**UNIVERSITY OF PERADENIYA**
**පේරාදෙණිය විශ්වවිද්‍යාලය**
**CENTER FOR DISTANCE & CONTINUING EDUCATION**

**දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**
**ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පරීක්ෂණය 2019**

**(2019 ඔක්තෝබර්)**

**ඉතිහාසය II (HG 2)**

**ක්‍රි. ව. 320 සිට 1707 දක්වා උතුරු ඉන්දියාවේ ඉතිහාසය**

කාලය පැය 03 යි.

**එක්** කොටසකින් යටත් පිරිසෙයින් **එක්** ප්‍රශ්නය බැගින් තෝරා ගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

සුදුසු තන්හි ඔබේ පිළිතුර දළ සිතියම් මගින් පහදන්න.

නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු කපාහරිනු ලැබේ.

මෙම ප්‍රශ්න පත්‍රයෙහි අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව දොළහ (12) කි.

---

## පළමුවැනි කොටස

1. ගුප්ත අධිරාජ්‍යය ආරම්භක අවධියේ පැවති දේශපාලන තත්ත්වය පරීක්ෂා කරන්න.
2. සමුද්‍රගුප්තගේ අලහබාද් අභිලේඛනයෙහි ඇති වැදගත්කම පහදන්න.
3. ගුප්ත යුගය තුළදී ඇති වූ ආගමික වර්ධනයන් සාකච්ඡා කරන්න.

## දෙවැනි කොටස

4. හර්ෂවර්ධනගේ කාර්ය සාඵල්‍යය විභාග කරන්න.
5. ඉන්දියාවේ අධිරාජ්‍ය මධ්‍යස්ථානයක් වශයෙන් කනෞජය නැගී ඒමට හේතු වූ සාධක පැහැදිලි කරන්න.
6. පාල, ප්‍රතීහාර, රාෂ්ට්‍රකූට රාජධානිවල පැවති දේශපාලන සංවිධානය පිළිබඳව විමසුමක් කරන්න.

## තුන්වන කොටස

7. ඉන්දියාවට එල්ල වූ අරාබි හා තුර්කි ආක්‍රමණ පිළිබඳව කෙටි විස්තරයක් කර එම ආක්‍රමණ සාර්ථක වීමට තුඩුදුන් හේතු පරීක්ෂා කරන්න.
8. දිල්ලි සුල්තාන් රාජ්‍යයේ දේශපාලන වර්ධනයට මොහොමඩ්- බින්- ටුග්ලුක්ගේ දායකත්වය පැහැදිලි කරන්න.
9. දිල්ලි සුල්තාන් රාජ්‍යයේ ආගමික ප්‍රතිපත්තියෙහි දක්නට ලැබුණු ප්‍රධාන අංග විචාරාත්මකව සාකච්ඡා කරන්න.

## හතරවැනි කොටස

10. මුස්ලිම්වරුන් හා හින්දූන් අතර සාමය හා සහජීවනය සඳහා මහා අක්බර්ගේ දායකත්වය ප්‍රමාණ කරන්න.
11. ෂා- ජහාන් යුගයේ මූගල් කලා හා ගෘහ නිර්මාණ ශිල්පයේ වර්ධනය විභාග කරන්න.
12. මූගල් යුගයේ පැවති සමාජ ව්‍යුහය පිළිබඳව ඓතිහාසික සටහනක් ලියන්න.